**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

****

## ශ්‍රී ලංකාව පුරා වෙසෙන සිසුන් 150 දෙනෙකුට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමීම

බත්තරමුල්ලේ පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී අද දින පවත්වන ලද විශේෂ උත්සවයකදී ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 හිම වෙසෙන ආ.පො.ස. උසස් පෙළ සිසුන් 150 ක් සඳහා 2017-18 වර්ෂයන් සඳහා වූ මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමිණ. ශිෂ්‍යත්ව පිරිනැමීම අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා, අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ගරු විජයකලා මහේස්වරන් මැතිණිය හා ඉන්දියානු මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා අතින් සිදු කෙරිණ. ශ්‍රී ලාංකේය සිසුන්ට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනමන දොළොස් වන වසර මෙය වේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ඉන්දියාව විසින් පොළොන්නරුවේ නව ත්‍රෛභාෂා පාසල හා මහනුවර සරස්වතී විද්‍යාලය සඳහා ලබාදෙන සහයෝගය අගය කළ අතර ශ්‍රී ලාංකේය ගුරුවර ගුරුවරියන්ට ඉන්දියාව විසින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව සිය ස්තුතිය ප්‍රකාශ කළේය. ලෝකය මහත්මා ගාන්ධි තුමාගේ 150 වන ජන්ම දිනය සමරන අවස්ථාවේදී ශ්‍රී ලාංකේය සිසුන් 150 දෙනෙකුට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව පිරිනැමීම සුවිශේෂී අවස්ථාවක් වන බව ඉන්දීය මහ කොමසාරිස්තුමා සඳහන් කළේය.

ඉන්දියාව උතුරේ පාසල් 27 ක නව පන්ති කාමර ඉදිකරනු ලබන අතර ඉන් 10 ක් දැනටමත් සිසු අයිතියට පත් කර ඇත. පසුගිය වසරේදී

ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් සතු විශාලතම ශ්‍රවණාගාරය මාතර රුහුණු විශ්ව විද්‍යාලයට ඉදිකර භාර දෙන ලද්දේ නැවත නොගෙවිය යුතු ප්‍රදාන යටතේය. සිය ජීවිතවල සුභවාදී පරිවර්තනයන් ළඟා කර ගැනීම සඳහා තරුණ ඉන්දියානුවන් තාක්ෂණය භාවිතා කරගන්නේ කෙසේද යන්න පැහැදිලි කළ මහ කොමසාරිස් තුමා මෑතකදී ඉන්දියානු සිසුන් පිරිසක් විසින් නිර්මාණය කරන ලද ලෝකයේ සැහැල්ලුම චන්ද්‍රිකාව වන “කලම්සැට්” චන්ද්‍රිකාව පිළිබඳවද එතුමා මෙහිදී සිහිපත් කළේය.

මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ තරුණ පරපුර සමඟ සම්බන්ධ වන ලෙස ශ්‍රී ලාංකේය සිසුන්ගෙන් ඉල්ලා සිටි අතර, ඉන්දියාවේ විද්‍යාත්මක සහ අධ්‍යාපනික සංවර්ධනයන්හි වාසිය ලබා ගන්නා ලෙස ආරාධනා කළේය. ඉන්දියානු තාක්ෂණ ආයතන සහ ඉන්දියානු කළමනාකරණ ආයතන ගෝලීය සන්නාමයන් බවට පත්ව ඇති බවත්, IIT ඒකාබද්දව ඇතුළත් වීමේ විභාගය සහ ඉංජිනේරු විද්‍යාව සඳහා උපාධිධාරී අභියෝග්‍යතා පරීක්ෂණය දැන් ශ්‍රී ලාංකේය සිසුන් සඳහා කොළඹදී පවත්වන බවත් එතුමා පැවසීය. ඉන්දියානු වෛද්‍ය විද්‍යාලවලයන්හි සහ දන්ත වෛද්‍ය විද්‍යා ධාරාවන්ට ප්‍රවේශවීම සඳහා අවශ්‍ය වන NEET(National Eligibility cum Entrance Test) විභාගය සඳහා පෙනී සිටීමට ශ්‍රී ලාංකේය සිසුන්ට අවසර ලබා දී ඇත.

ඉන්දියාව මෑතකදී “Study in India “ නමින් නව වෙබ් අඩවියක් එළි දැක්වූ බව මහ කොමසාරිස්තුමා සඳහන් කළේය. ඉන්දියානු අධ්‍යාපන ආයතනයන්හි අවස්ථා 25,000 කට වැඩි ප්‍රමාණයක් විදේශ සිසුන්ට වෙන් කර ඇති බව පැවසු එතුමා ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාව මෙම අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ලබා ගනු ඇතැයි විශ්වාසය පළ කළේය.

ඉන්දියාව වාර්ෂිකව ශ්‍රී ලාංකේය සිසුන් සඳහා ශිෂ්‍යත්ව 750 ක් පමණ පිරිනමයි. ශිෂ්‍යත්ව වැඩසටහන් සහ වෙනත් අධ්‍යාපනික සහයන් සඳහා

වැඩිදුර විස්තර ලබා ගැනීමට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ නිල වෙබ් අඩවිය වන www.hcicolombo.org වෙත පිවිසෙන්න.

*****